**<u>දිට්වා ආපදා තත්වය මත මධ්‍යම පළාත තුළ සිදුවූ හානිය යථාවත් කිරීමට අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) තනතුරුවල සේවය කළ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම. – 2026</u>**

දිට්වා ආපදා තත්ත්වය මත මධ්‍යම පළාත් සභාව යටතේ වන ආයතන විසින් නඩත්තු කරන භෞතික සම්පත් සඳහා වූ හානිය යථාවත් කිරීම සඳහා අවශ්‍ය තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ හෝ 1 ශ්‍රේණියේ තනතුරු වල සේවය කර විශ්‍රාම ලැබූ නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2019 හි විධිවිධාන ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.06.22 වේ.**

1. පොදු සුදුසුකම්
   - 1.1. තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ හෝ 1 වන ශ්‍රේණියේ තනතුරක සේවය කර විශ්‍රාම ලබා තිබිය යුතුයි.
   - 1.2. 2026.12.31 දිනට විශ්‍රාම ලබා වයස අවුරුදු 65 නොඉක්මවා තිබිය යුතුයි.
   - 1.3. සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
   - 1.4. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචි අයදුම්කරුවෙකුට ඉල්ලුම් කළ හැකිය.

2. බඳවා ගැනීමේ කොන්දේසි :
   - 2.1. විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම යන මැයෙන් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018හි විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2019හි විධිවිධාන අනුව මෙම කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම සිදු කරනු ලබයි.
   - 2.2. මේ සඳහා ඉල්ලුම් කරන විශ්‍රාමික නිලධාරීන් සියලුම දෙනා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම අනිවාර්යයෙන්ම සිදුකරන බවට නොසැලකිය යුතුයි.
   - 2.3. 2026.12.31 දින දක්වා කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර, සේවා අවශතාව මත එම කාලය දීර්ඝ කිරීම සිදු කළ හැකිය.

3. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන
   - 3.1. අයදුම්කරුගේ ජීවදත්ත පත්‍රිකාව
   - 3.2. මෙහි ඇමුණුම අංක 01 මගින් දක්වා ඇති EST – 09 ආකෘතිය
   - 3.3. මෙහි ඇමුණුම අංක 02 මගින් දක්වා ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි සඳහන් විශ්‍රාමිකයෙකු නැවත සේවයට බඳවා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ආකෘතිපත්‍රය, නිලධාරියා විශ්‍රාම ලබා ගන්නා අවස්ථාවේදි සේවය කළ ආයතනය අයත් ආයතන ප්‍රධානීන්ගේ (අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානී/ආයතන ප්‍රධානී) නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.
   - 3.4. උප්පැන්න සහතිකයේ මුල් පිටපත
   - 3.5. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක්
   - 3.6. නැවත සේවයේ යොදවන විශ්‍රාමික නිලධාරියා අදාළ තනතුරේ සේවය කිරීමට කායික/මානසික යෝග්‍යතාවයෙන් යුක්ත බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයේ මුල් පිටපත (ඇමුණුම 03)
   - 3.7. විශ්‍රාම ගැන්වීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක්

4. වැටුප් පරිමාණ
   - 4.1. විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම යන මැයෙන් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි විධිවිධාන අනුව ගෙවීම් සිදු කරනු ලබයි.

5. අයදුම්පත්‍රය ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.06.22** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ “ **ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර** ” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ “ **දිට්වා ආපදා තත්වය මත මධ්‍යම පළාත තුළ සිදුවූ හානිය යථාවත් කිරිමට අවශ්‍ය අතිරේක කාර්යය මණ්ඩලය සඳහා තාක්ෂණ සේවයේ (සිවිල්) තනතුරුවල සේවය කළ විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම – 2026** ” යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

6. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කොන්ත්‍රාත් පදනම මත පත්කරනු ලබන සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරිම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

7. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2026 ජූනි මස 05 වැනි දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.